www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ නිදහස් දිනය: යුද්ධයේ හා මිලිටරිවාදයේ හරඹයක්

## Sri Lankan Independence Day: a celebration of war and militarism

**කේ.රත්නායක විසිනි**
**2007 පෙබරවාරි 09**

පෙබරවාරි 4 දිනට යෙදී තිබුනු වාර්ෂික නිදහස් දින සමරුව ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් එල්ටීටීඊයට එරෙහිව අපකීර්තිමත් සිවිල් යුද්ධය ගැඹුරු කර උත්සන්න කිරීම සිය ආන්ඩුවේ අභිප්‍රාය වන බව පැහැදිලි කිරීම සඳහා යොදා ගත්තේ ය. සාමයේ අවශ්‍යතාවය ගැන දොඩවන අතර ම ඔහු ප්‍රකාශ කලේ "ද්‍රවිඩයන් විමුක්ත කර ගැනීම" සිය අරමුන වන බවයි. වෙනත් වචනවලින් කියතොත් දැනට එල්ටීටීඊය අත පවතින සියලු භූමිභාගයන් අල්ලා ගැනීමයි.

රට පුරා පවතින තත්වය පිලිබිඹු කරමින් නිදහස් සැමරුම පැවතුනේ අතිශය ආතති සහගත වටපිටාවකය. කොලඹ ප්‍රධාන හමුදා මූලස්ථානයට ආසන්න ගාලුමුවදොර දී එය පැවැත්වුනි. එල්ටීටීඊයෙන් එල්ල වියහැකි ප්‍රහාරයක් පිලිබඳ බය හිරන්තිය සහිත වතාවරනයක් ගොඩ නගමින් සිය ගනනක් අතිරේක හමුදාභටයන් ප්‍රදේශයේ යොදවා සිටි අතර සියලු මාර්ග වසා දමා අරක්ෂක විධිවිධාන තර කොට තිබුනි. දැනටමත්, රටේ අගනුවර හමුදාභටයන්ගේ සෝදිසි කිරීම් හා මාර්ග බාධකවලින් වටලනු ලැබ ඇති තැනක් ලෙස දර්ශනය වේ.

නිදහස් දිනට පෙර කොලඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල කල රාත්‍රී සෝදිසි මෙහෙයුම් මගින් අරක්ෂක හමුදාවන්, සිය ගනනක් දෙමල ජාතිකයන් අත්අඩංගුවට ගනු ලැබිනි. සිය අනන්‍යතාවය ඔප්පු කිරීමට හෝ කොලඹ රැඳී සිටීමට හේතු දක්වීමට අපොහොසත් වූ ඕනෑ ම අයෙක් අත්අඩංගුවට ගෙන පොලිස් සිරමැදිරිවලට ගාල් කරනු ලැබේ. කුප්‍රකට ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ බොහෝ දෙනෙක් දින නියමයක් නොමැතිව රඳවාගැනීම සඳහා ගාල්ලේ බූස්ස රැඳවුම් කඳවුර වෙත යවා තිබේ.

මිලිටරියේ ආධිපත්‍යය යටතේ පැවති නිදහස් සැමරුම තුල, යුද සෝෂාවේ හඬ ඉතා පැහැදිලිව ඇසුනි. දහස් ගනන් හමුදා භටයන් ද සහිත සන්නද්ධ රථ, මල්ටි බැරල් රොකට් විදිනයන් හා යුද ආම්පන්න, දිගු පෙලපාලියට ඇතුලත් විය. යුද නැව් සහ ප්‍රහාරක බෝට්ටු ආසන්න මුහුදේ අභ්‍යාසවල යෙදී සිටි අතර එල්ටීටීඊ පාලන ප්‍රදේශවලට බෝම්බ හෙලීමෙන් සිවිල් වැසියන් මරා දැමීමට සම්බන්ධ ප්‍රහාරක ජෙට් යානා ඉහල අහසේ සැරි සැරීය.

රාජපක්ෂගේ ජනතාවාදී රංගනයන් මධ්‍යයේ වුවත් ජනතාවගේ උද්යෝගිමත් ආචාර දැක්වීමක් දක්නට නොලැබුනි. දැඩි සෝදිසි කිරීම්වලින් පසුව ඉතා සුලු පිරිසකට පමනක් උත්සවයට සහභාගිවීමට ඉඩ ලැබුනි. මිලිටරි පාලනයක් සහිත යාපනය නගරය තුල බොහෝ ගොඩනැගිලිවල යුද්ධයට විරෝධය පලකරමින් ඔසවා තිබූ කලුකොඩි, සොල්දාදුවන් විසින් ඉවත් කරනු දැකගත හැකි විය.

මෙය, 2005 නොවැම්බරයේ දී ජනාධිපතිකම යන්තමින් දිනා ගත් රාජපක්ෂගේ දෙවැනි නිදහස් දින සැමරුමයි. මැතිවරන ව්‍යාපාරය තුල සාමය පොරොන්දු වූ ඔහු, ඉක්මනින් ම රට සිවිල් යුද්ධයට ඇද දැමී ය. ප්‍රකෝපකරනයේ හා ඝාතනයේ සැඟවුනු කැත යුද්ධයක් මාස ගනනාවක් තිස්සේ පවත්වා ගෙන යාමට මිලිටරියට හා එහි සහායක පැරා මිලිටරි කන්ඩායම්වලට ඉඩ සලසාදීමෙන් පසුව රාජපක්ෂ, සිංහල ගොවීන්ට ජලය සැපයීම සඳහා මාවිල්ආරු වාරිමාර්ග සොරොව්ව අල්ලා ගැනීම නිමිත්ත කර ගනිමින් විවෘත මිලිටරි ප්‍රහාරයන්ට නියෝග කලේ ය.

උත්සවයට පෙරාතුව රාජපක්ෂ, ඉහල හමුදා ජෙනරාල්වරුන් පිරිවරාගෙන මෑතකදී එල්ටීටීඊය වෙතින් අල්ලාගත් සාම්පූර් හා වාකරේ ප්‍රදේශවල සැරිසැරීය. 2002 වසරේ සටන් විරාම ගිවිසුම විවෘතවම උල්ලංඝනය කල ප්‍රහාරයක මෙහෙයුම්වල යෙදුනු සොල්දාදුවන් ලබා ගත් ජයග්‍රහන ඔහු හුවාදැක්වී ය. ආන්ඩුව සමග එකඟතාවයකට නොපැමිනෙන්නේ නම් "අප කොටින් (එල්ටීටීඊය) හීලෑ කල යුත්තෙමු" යයි අනතුරු ඇඟවීමේ ස්වරූපයෙන් ඔහු මාධ්‍යවෙත ප්‍රකාශ කලේ ය.

රාජපක්ෂගේ නිදහස් දින කතාව ද ඒ සමාන ම ආක්‍රමනශීලී විය. "එල්ටීටීඊයේ ලේ පිපාසිත ඉල්ලීම්වලට ඉඩ දීමට අප සූදානම් නැතැ"යි ප්‍රකාශ

කල ඔහු "බෙදුම්වාදය තීරනාත්මක ලෙස පරාජය කිරීම මගින් මෙම ශුද්ධ වු භූමියට ගෞරවය හා සෞභාග්‍යය ලඟාකර දීමේ මගේ මුලුමහත් කැපවීම ඔබ හමුවේ අවධාරනයෙන් ප්‍රකාශ කරන්නෙමි" යයි පැවසීය.

ඔහුගේ යුද්ධය සුජාත කිරීමේ නිවට උත්සාහයක යෙදෙමින් ජනාධිපති ප්‍රකාශ කලේ, "පනස්දාහකට වැඩි ජනතාවකගේ මූලික අයිතීන් උල්ලංඝනය කරමින් මාවිල්ආරු සොරොව්ව වසාදැමීම දක්වා ම මම එල්ටීටීඊයේ ප්‍රකෝපකාරීත්වයට ඉඩ නොදුන්නෙමි"යනුවෙනි. සැබැවින්ම රාජපක්ෂ විවෘත යුද්ධයට කල්යල් බලමින් සිටි අතර මානුෂවාදියෙකු ලෙස පෙනීසිටිමින් ඔහු සොරොව්ව වසා දැමීමේ සිද්ධිය එයට නිමිත්ත කර ගත්තේ ය. සිද්ධිය සමථයකට පත් කර ගැනීම සඳහා එල්ටීටීඊයේ ද සටන් විරාම නිරීක්ෂන කමිටුවේ ද උත්සාහයන් මධ්‍යයේ ම ඔහු ප්‍රහාරයන් සඳහා නියෝග දුන්නේ ය.

දේශපාලන දිව දෙකේ කථා මොනවට ප්‍රදර්ශනය කරමින් ඔහු ප්‍රකාශ කරන්නේ, නැගෙනහිර ගෙනයන මිලිටරි මෙහෙයුම් "අහිංසක ජනතාව මුදා ගැනීමෙන් සාමය සඳහා කරන දැවැන්ත කැපවීමක්" බවය. එහෙත් යථාර්ථයේදී උත්සන්න කෙරුනු මිලිටරි මෙහෙයුම් මගින් ලඟාකර දී ඇත්තේ කිසිවක් නොව කාලකන්නිකමයි. පසු ගිය වසර තුල සිය ගනනක් සිවිල් වැසියන් ඝාතනය කොට ඇති අතර දසදහස් ගනනක් සරනාගතයන් බවට පත්කර තිබේ. ආරක්ෂක හමුදාවන්ගේ රැකවල් යටතේ ක්‍රියාත්මකවන ඝාතක කල්ලි බොහෝදෙනෙක් පැහැරගෙන ගොස් හෝ මරාදමා ඇත. මිලිටරි වියදම් ඉහල නගිද්දී සමස්තයක් ලෙස ජනතාව අහස උසට නැගෙන මිල ගනන් හා පිරිහෙන ජීවන තත්වයන්ගේ බරින් මිරිකී ඇත.

මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීම පිලිබඳව එල්ටීටීඊය නම්දරා සිටින නමුදු, 1980 ගනන් මුල යුද්ධය ප්‍රකුපිත කල අඛන්ඩ දෙමල විරෝධී නොපනත් කම් අවසානයකට ගෙන ඒම සමග " අහිංසක දෙමල ජනතාව මුදාගැනීම" පිලිබඳ රාජපක්ෂගේ පුරසාරම්වලට කිසිදු සම්බන්ධයක් නැත. සාම්පූර් හා වාකරේ වැනි අල්ලාගත් ප්‍රදේශවල දී මිලිටරිය ඔල්වරසන් දෙන ජනතාවගේ පිලිගැනීමට ලක් නොවුනු අතර දක්නට ලැබුනේ ආහාර සොයා ගැනීමේ හා යුද්ධයෙන් පලා යෑමේ උවමනාවෙන් පෙලෙන ඇදීගිය මුහුනුවලින් යුත් අනාතයින්ගේ දිගු පෝලිම් ය. රාජපක්ෂගේ "විමුක්තියෙහි" අර්ථය වෙන කිසිවක් නොව එල්ටීටීඊය මිලිටරි වශයෙන් පොඩිපට්ටම් කර සමස්ත දිවයින ම ආන්ඩුවේ පාලනය යටතට ගෙන ඒමේ ලේවැකි යුද්ධයයි.

රාජපක්ෂ සිය ශ්‍රාවකයන්ගෙන් ඉල්ලා සිටියේ "ආනන්ද සංගරී හෝ ඩග්ලස් දේවානන්ද වැනි මහතුන් සමග එකගවීමට තරම් සාධාරන හා උතුම්වන ලෙස"යි. ජනාධිපතිගේ යුද්ධයෙහි මෙම දෙමල ආධාරකරුවන් දෙදෙනාම නම්දරූ අවස්ථාවාදීන් මෙන්ම එල්ටීටීඊයේ උග්‍ර විරුද්ධවාදීන් ය. කැබිනට් ඇමතිවරයෙකු වන ඩග්ලස් දේවානන්ද ඊපීඩීපී සංවිධානයේ නායකයා ද වන අතර එය උතුරේ ආන්ඩුවේ විරුද්ධවාදීන් බිය ගන්වමින් හා අඩන්තේට්ටම් කරමින් ආරක්ෂක හමුදාවල සහායක සන්නද්ධ බලඇනියක් ලෙස කටයුතු කරයි.

රාජපක්ෂ යුද්ධයට යොමු වී ඇත්තේ ශක්තිමත් තැනක සිට නොව ප්‍රගාඪ දේශපාලන දුබලතාවයක පිහිටමින් ය. නිදහස් සමරුවට සතියක් වන තෙක් ම ඔහු නායකත්වය දුන්නේ, එල්ටීටීඊයට එරෙහිව පූර්න පරිමානයේ යුද්ධයක් සඳහා විවෘතව පෙනී සිටින සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන හා ජාතික හෙල උරුමය යන පක්ෂ දෙකේ පාර්ලිමේන්තු සහයෝගය මත පදනම් වූ සුලුතරයේ ආන්ඩුවක් මතය.

සති ගනනාවක් උපාමාරු දැමීමෙන් පසුව රාජපක්ෂ, විරුද්ධ පක්ෂයේ එක්සත් ජාතික පක්ෂය හැර ගිය හා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ සාමාජිකයන්ගෙන් පාර්ලිමේන්තු බහුතරයක් සකසා ගත්තේ ය. ජාහෙඋ ද විධිමත් පරිදි ආන්ඩුවට එකතු විය. සභාගය එකට තබා ගැනීම සඳහා ඔහු 108 දෙනෙකුගෙන් යුත් ලෝකයේ විශාලතම කැබිනට්ටුව සඳහා, සියල්ලන්ට ම වාගේ ඇමති පදවි පිරිනැමීය.

ආන්ඩුව ප්‍රතිවිරෝධයන්ගෙන් හා ගැටුම්වලින් ඉරිතලා ගොස් තිබේ. එක්සත් ජාතික පක්ෂයෙන් පැමිනි සාමාජිකයන් ජාහෙඋ තරයේ ම විරුද්ධව සිටින ඊනියා සාම ක්‍රියාදාමයේ ආධාරකරුවන් ලෙස ප්‍රකට ය. රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් දෙදෙනෙකු වන මංගල සමරවීර හා අනුර බන්ඩාරනායක සිය නව කැබිනට් තනතුරු පිලිබඳ අසතුටට පත්ව නිදහස් උත්සවයට සහභාගි වීම පවා ප්‍රතික්ෂේප කලහ. තවත් ඇමතිවරු දෙදෙනෙක් ලෝකයේ විශාලතම කැබිනට්ටුවේ කොටස්කරුවන් වීම "ලජ්ජාවට" කරුනක් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කලහ. එයට ප්‍රතිචාර ලෙස රාජපක්ෂ අනතුරු ඇඟවූයේ ආන්ඩුවට සහාය නොදක්වන ඕනෑ ම අයෙක් " පක්ෂයෙන් ඉවත්විය යුතු" බවයි.

දේශපාලන අර්බුදය පිටුපස ඇත්තේ රට යලිත් යුද්ධයට ඇද දැමූ දූෂිත දේශපාලන සංස්ථාපිතයේ සමස්තය කෙරෙහි ම ඇති ජනතාවගේ ගැඹුරු පිලිකුලයි. පුලුල්ව පැතිර ඇති මෙම අතෘප්තිය කෙරෙහි රාජපක්ෂගේ ප්‍රතිචාරය වන්නේ තවතවත් වාර්ගික හැඟීම් ඇවිස්සීමත් කුමන හෝ දේශපාලන විරුද්ධත්වයක් මැඩීම සඳහා සූදානම් වීමත් ය.

සිය කථාව තුල දී ජනාධිපති "මාතෘභූමියේ ආරක්ෂාව වෙනුවෙන්" සියල්ලන් ම රැලි විය යුතු යයි ඉල්ලා සිටියේ ය. ඔහුගේ ආර්ථික සංවර්ධන

ව්‍යාපෘතීන්ටත්, "සංස්කෘතික උරුමයන්" රැකගැනීමටත්, "ත්‍රස්තවාදයට එරෙහි අරගලයටත්" වින කටින අවස්ථාවාදීන් ලෙස ඔහු සිය විරුද්ධවාදීන් හෙළාදැකීය.

තර්ජනාත්මක විලාසයකින් ඔහු ප්‍රකාශ කලේ " රටේ ස්ථාවර භාවයට අභියෝගයක් විය හැකි කුමන හෝ ක්‍රියා මාර්ගයකට අවතීර්න නොවිය යුතු බව දැඩි වගකීමෙන් යුක්තව මම ඔබට කියා සිටිමි. පන ගැටගසා ගැනීමට හුස්ම අදින ත්‍රස්තවාදයට දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔක්සිජන් ලබා නොදෙන ලෙස විශේෂයෙන් ම මෙරට වැඩ කරන ජනතාවගෙන් ඉල්ලා සිටීමට මෙය හොඳ ම වේදිකාව යයි මම විශ්වාස කරමි. මේ සම්බන්ධයෙන් වගකීමෙන් කටයුතු කල යුතු යයි මම මාධ්‍ය වෙතින් ද ඉල්ලා සිටිමි" යනුවෙනි.

ආන්ඩුව දැනටමත් වැඩ වර්ජනය කරන කම්කරුවන් මැඩීමට ආරක්ෂක හමුදාවන් යොදාගෙන ඇති අතර සැබැවට ම යුද්ධය පිලිබඳව වාරනයකට සමාන තත්වයක් ගොඩනගා ඇත. මෑතක දී සවිමත් කර යලි ක්‍රියාත්මක කල ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ "ත්‍රස්තවාදයට ආධාර කිරීමේ" චෝදනාව මත ඕනෑ ම අයෙක් අත්අඩංගුවට ගෙන රඳවා තැබීමට පොලීසියට හා මිලිටරියට බලය පැවරේ. රාජපක්ෂගේ ප්‍රකාශයන් පැහැදිලිව ම අඟවන්නේ මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති ඕනෑ ම දේශපාලන විරුද්ධවාදියෙකු, විශේෂයෙන් ම වැඩ කරන ජනතාව මැඩීම සඳහා යොදාගැනීමට ඔහු අදහස්කර සිටින බවයි.

© www.wsws.org